**ශීර්ෂය -009 පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය - 2025**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලටඅදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක්අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු අදාල රෙගුලාසි අනුව පිළියෙළ කළ යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් සියයට 20 සිට සියයට 100 දක්වා වූ රු.4,680,449 ක ප්‍රතිපාදන ද, ප්‍රාග්ධන වැය විෂයක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් සියයට 33 ක් වූ රු.33,000 ක ප්‍රතිපාදන ද උපයෝජනය කර නොතිබීමෙන් ඇස්තමේන්තු එකී රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | බදවා ගැනීම අඩුවීම, සතිඅන්ත හා නිවාඩු දිනවල අතිකාල සීමා කිරීම, දීමනා වැටුපට එකතු වීම, අපේක්ෂා කල පරිදි ගමන් වියදම් ඇති නොවීම,ලිපිද්‍රව්‍ය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම,නිලධාරීන් දෙදෙනකු හැර අනෙක් නිලධාරීන් නිල ඇඳුම් ලබා ගැනීමට සුදුසුකම් සපුරා නොතිබීම,අපේක්ෂා කරන ලද වාහන යන්ත්‍ර මෘදුකාංග අලුත්වැඩියා ඇති නොවීම, තැපැල් වියදම් අවම වීම,ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලට වඩා අඩු මිලකට සේවාව ලබා ගැනීම,රක්ෂණ වාරිකය අඩුවීම ලෙස හේතු සඳහන් කර ඇති බව. | ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදි පුරෝකථනයන් සහිතව හැකිතාක් තාත්ත්විකව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු දැන ගැනීමේ | අධිකාරයේ ඉකුත් වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙත | වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර යැවීමට |

| | | | | |
|---|---|---|---|---|
| | පනතේ 10 වගන්තිය | අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | යැවිය යුතු වාර්ෂික වාර්තාව මින් ඉදිරියේදී යැවීමට කටයුතු කරන බව දන්වා ඇත. | කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 නොවැම්බර් 30 දිනැති අංක 02/2018 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු හෙයින් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>රෙගුලාසිය 261(2) | චෙක්පතක් මඟින් ගෙවීම් කෙරෙන කල චෙක්පතේ අංකය වවුචරයේ මෙන්ම මුදල් පොතේ නියමිත සටහන ඉදිරියෙන් සටහන් කල යුතු බව දක්වා තිබුණද කොමිෂන් සභාව විසින් අවස්ථා 26 කට අදාලව චෙක්පත් අංක එපරිදි සඳහන් කර නොතිබුණි. | චෙක්පත් අංකය,මුදල් පොතේ මෙන්ම වවුචරයේ සටහන් කිරීම ප්‍රමාද දෝෂයකින් විමසුමේ සඳහන් අවස්ථා වල දී සටහන් කර නොතිබුණු අතර නැවත එසේ නොවීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු ය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 දැක්ම හා මෙහෙවර

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 ජනවාරි 01 දින වන විට අභියාචනා 1074 ක් පැවති අතර වර්ෂය තුළදී අභියාචනා 837 ක් අවසන් කර තිබීමෙන් වර්ෂය අවසානයේ අභියාචනා 910 ක් ඉතිරිව පැවතුණි. එම ඉතිරිව පැවති අභියාචනා තුල අභියාචනා ලද දිනය අනුව සැලකීමේදී වර්ෂ 2 ත් 4 ත් අතර ලද අභියාචනා 297 ක් සහ වර්ෂ 5 හෝ ඊට වැඩි අභියාචනා 115 ක් විය. | ඉදිරියට ගෙන ආ ශේෂය, නව පැවරුම්, අවසන් කළ සහ ඉතිරි අභියාචනා සහ ඒවායේ සංඛ්‍යාලේඛන වලින් කාර්ය සාධනය මැනිය නොහැකිය. එක් එක් අභියාචන වලට ආවේණික වූ එක් එක් කරුණු වලට අවධානය යොමු කරමින් අභියාචන සම්බන්ධ නියෝග/තීරණ දෙනු ලබයි.<br>තවද, එක් එක් කොමිෂන් සභාවන් හි තීරණයන්ට එරෙහිව මෙම විනිශ්චය අධිකාරයට ඉදිරිපත් කර | අභියාචනා විසඳීමේ ප්‍රමාදයන් මගහරවා ගත යුතු අතර පැමිණිලි අවසන් කිරීමේ ප්‍රගතිය ඉහළ නංවා ගැනීමට කටයුතු කල යුතු ය. |

| | | |
|---|---|---|
| | ඇති අභියාචනා ප්‍රමාණය එයින් ඉඩදී තිබූ හා ප්‍රතික්ෂේප කර තිබූ අභියාචනා මත කාර්ය සාධනය පිළිඹිබුවනවා ඇති බව. | |

## 4.2 සැළසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| අංක 2/2020 දරන 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය හා මාර්ගෝපදේශයේ සදහන් ආකෘතියට අනුකූල වන ලෙස, වගකීමේ ක්ෂේත්‍ර, ක්‍රියාකාරකම්, ප්‍රතිපාදන (Input) හා ප්‍රතිඵලය (Outcome) ඇතුලත්කර 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අතපසුවීමක් නිසා 2025 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2026 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඔබ වෙත එවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන සහ මාර්ගෝපදේශයට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

## 5. යහපාලනය

## 5.1 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, 2015 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. | මෙම කාර්යාලයේ කාර්ය මණ්ඩලය ඉතා සීමිත බැවින් ද, ගිණුම් හා වෙනත් පරිපාලන කටයුතු විශේෂයෙන් මූල්‍ය ගණුදෙනු, සේවක පඩිනඩි ගෙවීම සහ අත්‍යවශ්‍ය කාර්යාල උපකරණ මිලදී ගැනීමකට පමණක් සීමා වන බැවින් ද, අනුමත කාර්ය මණ්ඩලයේ විගණන නිලධාරියකු අනුමත කර නොමැති හෙයින්ද, විශේෂයෙන් විගණන නිලධරයන් පත් කිරීම, රජයට අමතර මූල්‍ය වියදමක් දැරීමක් මෙන්ම එසේ පත් කරනු ලබන නිලධාරියකුට ඉටු කිරීමට තරම් කාර්යභාරයක් නොමැති බව. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 32 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 23 ක් වූයෙන් කාර්ය මණ්ඩලයේ තනතුරු 09 ක පුරප්පාඩු තවදුරටත් පැවතුණි. එමෙන්ම ලේකම්, සහකාර ලේකම් යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු කොන්ත්‍රාත් පදනම මත 2017 වර්ෂයේ සිට වාර්ෂිකව අලුත් කරමින් පත්කර ගෙන තිබුණි. | 2025 වර්ෂයේ කාර්ය මණ්ඩල අත්‍යවශ්‍ය පුරප්පාඩු 04 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර ඇත. ගණකාධිකාරිවරයකු වැඩ බැලීමේ පදනම මත ද, ලේකම් සහ සහකාර ලේකම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2018 යටතේ ද, බඳවා ගෙන ඇති බව. | කාර්යසාධනය සමඟ විශ්ලේෂණය කර අවශ්‍යතාවය පවතී නම් පමණක් බඳවා ගැනීම් කළ යුතුය. |